# බුද්ධ ධර්මය විෂය ඉගැන්වීමෙහිලා සිංහල භාෂාවේ උපයෝගීතාව (ප්‍රාථමික ශ්‍රේණි සඳහා නිර්දිෂ්ට පාඨ්‍ය ග්‍රන්ථ ඇසුරින්)

ප්‍රදීප් ඉඳුනිල් පියරත්න

## හැඳින්වීම

ප්‍රාථමික ශ්‍රේණිවල උගන්නා සිසුන්, බෞද්ධ දහම් පාසල් ඇසුරෙහි දහම් අධ්‍යාපනය ලබනු හැරුණු විට බුද්ධ ධර්මය විෂය විධිමත් ව හැදෑරීම ආරම්භ කරනුයේ පාසල් පන්ති කාමරයෙනි. එහි දී පන්ති කාමර ඉගෙනුම් ආධාරයක් වශයෙන් ප්‍රබල වශයෙන් උපයෝගී වන්නේ බුද්ධ ධර්මය විෂය පෙළපොත් ය. එසේම ආගමික පාඨ්‍ය ග්‍රන්ථ කියවීමේ සමාරම්භය සිදුවන්නේ ද මෙම පෙළ පොත් ඇසුරෙනි. එබැවින් මෙම පාඨ්‍ය ග්‍රන්ථවල වැදගත්කම සුවිශේෂ වේ. මෙම බුද්ධ ධර්මය විෂය පෙළපොත් සියල්ලම රචනා වී ඇත්තේ සිංහල භාෂාවෙනි. ශ්‍රී ලංකාවේ පාසල්වල ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන සිසුන් පවා බුද්ධ ධර්මය විෂය හැදෑරිය යුත්තේ සිංහල භාෂාවෙනි. එය අනිවාර්ය කොට තිබේ. මෙම පර්යේෂණයේ දී අපගේ අවධානය යොමු වන්නේ එම පෙළපොත් රචනා කිරීම සඳහා උපයුක්ත භාෂා මාධ්‍යය පිළිබඳ අධ්‍යයනය කිරීම හා එහි උපයෝගීතාව පරීක්ෂා කිරීමයි. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ බුද්ධ ධර්මය විෂය ඉගැන්වීමේ දී සිංහල භාෂාවේ උපයෝගීතාවක් පවතින්නේ කවරාකාරයෙන්ද යන්න පරීක්ෂා කිරීම යි.

මේ සඳහා උපයෝගී කර ගැනෙන්නේ පළමු වන ශ්‍රේණිය සිට පස්වන ශ්‍රේණිය දක්වා සම්පාදිත බුද්ධ ධර්මය පෙළපොත්වල විෂය සන්ධාරය යි. ජාතික අධ්‍යාපන ආයතනයෙන් සපයන විෂය නිර්දේශයට අනුකූල ව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරන මෙම පෙළපොත්වල විෂය අන්තර්ගතය පිළිබඳ පොදු සමාජයෙහි විවිධ සංවාද හා විසංවාද පැවතිය ද පෙළපොත් විෂයෙහි සිදු කර ඇති පර්යේෂණ සාහිත්‍යය එතරම් ප්‍රබල නොවන බව ද මෙම පර්යේෂණයේ දී අනාවරණය විය. එම පර්යේෂණ සාහිත්‍යය විෂයෙහි යම් දායකත්වයක් සැපයීමට ද අපගේ මෙම පර්යේෂණයෙන් හැකි වනු ඇත. මෙහි පර්යේෂණයේ අරමුණු කිහිපයකි. ප්‍රධාන අරමුණ වන්නේ බුද්ධ ධර්මය විෂයට අදාළ පෙළපොත් රචනා කිරීමේ දී යොදා ගත් භාෂාවේ ස්වරූපය කවරාකාර ද යන්න හඳුනා ගැනීම යි. එම ප්‍රධාන අරමුණු හා සමගාමී ව ප්‍රාථමික ශ්‍රේණි සඳහා බුද්ධ ධර්මය පෙළ පොත් රචනා කිරීමේ දී උපයෝගී කොට ගෙන ඇති භාෂා උපක්‍රම කවරේදැයි හඳුනා ගැනීම, පෙළ පොත් රචනා කිරීමේ උපයුක්ත භාෂා ශෛලිය හඳුනා ගැනීම, පෙළපොත් සඳහා උපයෝගී කොට ගෙන ඇති වාග්මාලාව හඳුනා ගැනීම, සිංහල භාෂාවට අමතර ව පෙළ පොත් සඳහා යොදා ගෙන ඇති වෙනත් භාෂා කවරේද යන්න හඳුනා ගැනීම, ධර්ම ප්‍රචාරණයේ දී භාෂාවේ වැදගත්කම පරීක්ෂා කිරීම ආදිය ද අනෙකුත් අරමුණු විය. මෙම පර්යේෂණය සඳහා අදාළ වූ කාල සීමාව

සීමාසහිත වූ බැවින් 1 වන ශ්‍රේණියේ සිට 11වන ශ්‍රේණිය දක්වා සියලුම බුද්ධ ධර්මය පෙළ පොත් මෙම සන්ධාර විශ්ලේෂණ සඳහා පදනම් කර නොගත් අතර 1 වන ශ්‍රේණිය සිට 5 වන ශ්‍රේණිය දක්වා ප්‍රාථමික අවධියට අයත් පෙළපොත් පදනම් කර ගැනීම, පාසල් විෂයමාලාවේ ඇතුළත් විෂය අතුරින් බුද්ධ ධර්මය විෂය පමණක් තෝරා ගැනීම මෙම පර්යේෂණයේ පර්යේෂණ සීමා විය.

**පර්යේෂණ ක්‍රමවේදය**

බුද්ධ ධර්මය විෂය ඉගැන්වීමෙහිලා සිංහල භාෂාවේ උපයෝගීතාව කවරාකාර ද යන්න, අදාළ පෙළ පොත් ඇසුරෙන් විමර්ශනය කෙරෙන මෙම පර්යේෂණයේ දී එය වඩාත් හොඳින් සිදු කළ හැක්කේ ගුණාත්මක අධ්‍යයන ප්‍රවේශය වෙතිනි. එබැවින් ගුණාත්මක සංකල්පවලින් හෙබි පෙළ පොත් ආශ්‍රිත ව සිදුකරන මෙම භාෂා විශ්ලේෂණය සංඛ්‍යාත්මක දත්ත පදනම් ව සිදු කිරීම යෝග්‍ය නොවන නිසා ගුණාත්මක අධ්‍යයනය ක්‍රම ශිල්පය යටතේ සන්ධාර විශ්ලේෂණය සිදු කෙරිණි. පුස්තකාල පරිශීලනය මගින් දත්ත සපයා ගෙන ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සන්ධාරය විශ්ලේෂණයෙහිලා ප්‍රමුඛ අවධානයක් යොමු කරමින් මෙම පර්යේෂණය සිදු කෙරිණි .

මෙම පර්යේෂණයේ දත්ත එක් රැස් කිරීමේ ප්‍රධාන මූලාශ්‍රය වූයේ 1- 5 දක්වා බුද්ධ ධර්මය පෙළ පොත් ය. එයට අමතර ව පෙළ පොත් හා ආගමික ඉගැන්වීම් ආශ්‍රිත ශාස්ත්‍රීය ලේඛන ද උපයෝගී කර ගැනිණි.

**පර්යේෂණ අනාවරණ**

බුද්ධ ධර්ම විෂය ඉගැන්වීමේ දී පෙළ පොත ප්‍රබල ඉගෙනුම් ආධාරයක් බව මෙම අධ්‍යයනයේ දී අනාවරණය විය. ප්‍රාථමික අධ්‍යාපනයේ දී සැලකිල්ලට ගන්නා පළමු ප්‍රධාන අවධිය, දෙවන ප්‍රධාන අවධිය හා තෙවන ප්‍රධාන අවධියට යෝග්‍ය වන පරිදි බොහෝ දුරට සිංහල භාෂාව භාවිත කර තිබෙන බව අනාවරණය විය. පළමු ප්‍රධාන අවධියේ දී කුඩා දරුවන් සිතුවම් කෙරෙහි නැඹුරු වන බැවින් භාෂාත්මක ප්‍රකාශනවලට වඩා සිතුවම් විෂයෙහි වැඩි අවධානයක් යොමු කර ඇති බව ද අනාවරණය විය.

අනුක්‍රමික ව ඉහළ ශ්‍රේණිවල දී භාෂා ප්‍රකාශනය ඇසුරෙහි වැඩි අවධානයක් යොමු ව තිබේ. භාෂාත්මක විස්තර කථන ආදිය වඩාත් හොඳින් දරුවන්ට අවබෝධ කරවීම සඳහා යෝග්‍ය සිතුවම් භාවිත කර ඇති ආකාරය ද අනාවරණය විය. සිසුන්ට වුව ස්වයං අධ්‍යයනයට මග සැලසෙන අයුරින් සරල භාෂා භාවිතයක් මෙම පාඨ්‍ය ග්‍රන්ථ සියල්ලෙහි අන්තර්ගත විය.

කෙටි වැකි භාවිතය, කෙටි ඡේද භාවිතය මෙන්ම ප්‍රාථමික අවධියේ සිසුන්ට සමීප වාග්මාලාවක් උපයෝගී කර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කර ඇති බව නිරීක්ෂණය විය. යෝග්‍ය පරිදි පාලි ගාථා පාඨ උපුටා දක්වා ඇති ආකාරය ද ප්‍රකට විය. එමෙන්ම ඒවායේ සිංහල අරුත් පැහැදිලි කිරීම් ද සරල ලෙස දක්වා තිබිණි. බෝසත් චරිතය, බුද්ධ චරිතය, ශ්‍රාවක ශ්‍රාවිකා චරිත, බුදු දහමේ සංකල්ප, බෞද්ධ ඉතිහාසය, බෞද්ධ සිරිත් විරිත් ආදි විෂය කරුණු සිංහල භාෂාවෙන් පැහැදිලි කිරීම සඳහා කතන්දර ප්‍රවේශය, කෙටි විස්තරාත්මක කථනය මෙන්ම කවි හා ගීත ආදිය යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි විය. එමෙන්ම පෙළපොත්හි අන්තර්ගත පාඩම් සඳහා සිංහල භාෂාවේ

ලිඛිත හා කථිත ව්‍යවහාරය උපයෝගී කොට ගෙන ඇති ආකාරය ද අනාවරණය විය. මෙම පෙළපොත් රචනා කිරීම සඳහා එකම මණ්ඩලයක් අඛණ්ඩ ව කටයුතු කිරීමෙන් පෙළපොත්වල භාෂා ශෛලියෙහි ඒකමිතිකභාවයක් දැකිය හැකි විය.

**නිගමනය**

විධිමත් අයුරින් බුද්ධ ධර්මය හැදෑරීමට පාසල් සිසුන් සඳහා ඇති ප්‍රබල ඉගෙනුම් ආධාරකය පාසල් බුද්ධ ධර්මය පෙළ පොත බව කිව යුතු ය. ප්‍රාථමික අවධියේ දී සිටම ආගමික අධ්‍යාපනය ලබා දීම විෂයෙහි පෙළ පොත උපයෝගී වන බව අවධානයට ලක් විය යුත්තකි. එහි දී ආගමික විෂය ඉගැන්වීම් සඳහා සිංහල භාෂාවේ අනේක භාෂාත්මක ශක්‍යතා ප්‍රයෝජනයට ගත යුතු ආකාරය ද තවත් අධ්‍යයනයට ලක්විය යුතු ය.

සිසුන්ගේ ආවේදන කුසලතා සංවර්ධනය සඳහා වැඩි අවධානයක් යොමු වන පරිදි භාෂාව භාවිත කිරීම වඩාත් යෝග්‍ය වේ. එසේම උපයුක්ත කථාන්තර ආදිය මගින් තත්‍ය ලෝකයේ යථාර්ථය ද ඉස්මතු කිරීමට භාෂාව උපයෝගී කර ගත යුතු ය. භාෂා භාවිතයේ දී විශේෂයෙන් පුද්ගල නාමකරණ ආදියේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ද අවධානය යොමු කිරීම වඩාත් සුදුසු ය. එහි සමබරතාව පිළිබඳ අවධානය යොමු කිරීම ද අතිශය වැදගත් ය. දීර්ඝ විස්තරාත්මක කථන අවම කොට ආගමික කරුණු ඉගැන්වීමේ දී කතන්දර කවි ගීත විෂයෙහි වැඩි අවධානයක් යොමු කිරීම ඵලදායි වේ. ආගමික කරුණු පිළිබඳ රචනා කිරීම්වල දී ඒවායේ ප්‍රායෝගිකත්වය පිළිබඳව ද භාෂාව ඇසුරෙන් ඉස්මතු කිරීමට ප්‍රයත්න දැරිය යුතු ය. එමෙන්ම මෙම පාඨ්‍ය ග්‍රන්ථ විෂයෙහි පොදු සමාජයේ අවබෝධය වැඩි කිරීම සඳහා ද වැඩපිළිවෙළක් සකස් කළ යුතු ය. එමගින් ලැබෙන ප්‍රතිචාර ඉදිරි සංශෝධන සඳහා උපයුක්ත කර ගැනීම විෂයෙහි ද අවධානය යොමු විය යුතු ය.

**ප්‍රමුඛ පදඃ** පෙළපොත්, බුද්ධ ධර්මය, පාසල් විෂය, ප්‍රාථමික ශ්‍රේණි, සිංහල භාෂාව

**විමර්ශිත ග්‍රන්ථ**

පළමු වන ශ්‍රේණිය බුද්ධ ධර්මය (2021) බත්තරමුල්ල ඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

දෙවන වන ශ්‍රේණිය බුද්ධ ධර්මය (2021) බත්තරමුල්ල ඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

තුන් වන ශ්‍රේණිය බුද්ධ ධර්මය (2021) බත්තරමුල්ල ඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

හතරවන ශ්‍රේණිය බුද්ධ ධර්මය (2021) බත්තරමුල්ල ඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පස්වන ශ්‍රේණිය බුද්ධ ධර්මය (2021) බත්තරමුල්ල ඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව